## පාණදුර සාහිත්‍යයක් ගොඩනැගීමට බලපෑ සමාජයීය පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

## (1873 පාණදුරාවාදයෙන් පසු අවධිය)

එච්.ඩී.කේ. නදීකා - සිංහල අධ්‍යයනාංශය

19 වන සියවසේ අග භාගය සහ 20 වන සියවස තුළ පාණදුර නගරය කේන්ද්‍ර කොටගෙන බිහි වූ සාහිත්‍යය, "පාණදුර සාහිත්‍යය" ලෙස දැක්වේ. පාණදුර නගරය අනුරාධපුරයේ සිට පුරාතනය දක්වා ම විවිධ කාලවල දී විවිධ හේතූන් මත වැදගත් වූ බව මහාවංශය, සැළලිහිණි, ගිරා සන්දේශ වැනි සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් වී තිබේ. 19 වන සියවස එනවිට පාණදුර නගරය විශේෂයෙන් ප්‍රකට වීමට බලපෑ ප්‍රධාන හේතුව පාණදුරාවාදයයි. 1873 දී පැවැත්වූ පාණදුරාවාදයෙන් පසුව බෞද්ධ පුනර්ජීවනයේ අගනගරය බවට පත්වූ පාණදුරය ජාත්‍යන්තරය තුළ පවා ප්‍රසිද්ධියට පත්විය. මෙකල පාණදුරයේ වාසය කළ කරාව කුලයට අයත් කොටසක් අරක්කු රේන්ද වෙළඳමෙන් විශාල ධනයක් උපයා ගත්හ. මේ ව්‍යවසායකයින් අතරින් පාණදුර විසූ ඩයස් පවුල හා පෙරේරා පවුල ආදි ධනවතුන් ඔවුන්ගේ ධනය ආගමික හා අධ්‍යාපනික දියුණුව උදෙසා පරිත්‍යාග කිරීම, ශාස්ත්‍රීය පුනරුදයක් ඇතිවීම කෙරෙහි බලපෑවේය. එම ධන පරිත්‍යාගවලින් පාසල් හා පිරිවෙන් රැසක් පාණදුරය පුරා බිහිවිය. "පාණදුර රන්කොත් විහාරයේ සෞගත විද්‍යාල පිරිවෙන" සහ "වලාන ශ්‍රී විජය සෞගත පිරිවෙන" මෙහි දී ප්‍රධානත්වයක් ගනු ලැබීය. මෙම අධ්‍යාපනික පුනර්ජීවනය හේතුවෙන් විශිෂ්ට සාහිත්‍යධරයන් රාශියක් පාණදුරයෙන් බිහිවීමත් ඔවුන් පාණදුරයේ සිට සිංහල සාහිත්‍යය පෝෂණය කිරීමත් දැකිය හැකිය. ඔවුන් අතර මහාචාර්ය ගුණපාල මලලසේකර, කුමාරතුංග මුනිදාස, අලවු ඉසි සැබිහෙළ වැන්නෝ ප්‍රධාන තැනක් ගත්හ. මොවුන් ඇති කළ ශාස්ත්‍රීය උන්නතිය පසු කලෙක භාෂාව හා ව්‍යාකරණය, නිර්මාණාත්මක, ආගමික සාහිත්‍යය ආදි විවිධ විෂය ක්ෂේත්‍ර ගණනාවක් පුරා විහිදී ගොස් "පාණදුර සාහිත්‍යයක්"ලෙස සංවර්ධනය වනු දැකිය හැකිය. මෙම අධ්‍යයනය මඟින් පාණදුරට ආවේණික වූ සාහිත්‍යයක් ගොඩනැගීමට සමාජ, ආර්ථික, ආගමික මෙන් ම අධ්‍යාපනික පසුබිම කවරාකාරයෙන් බලපා ඇත්ද යන්න පිළිබඳ අවධානයට යොමු කෙරේ. මෙම පර්යේෂණයට අදාළ වන්නා වූ දත්ත එක්රැස් කරගැනීම සඳහා මූලික දායකත්වයක් සැපයෙන්නේ පුස්තකාල සමීක්ෂණ විධික්‍රමයයි. පාණදුර නගරය පිළිබඳ සඳහන් සම්භාව්‍ය ග්‍රන්ථ, ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර මඟින් සාකච්ඡාවට යෝග්‍ය වන දැනුම විමර්ශනය කිරීම සිදුවේ. එසේ අනාවරණය කර ගන්නා දත්ත මත පදනම් වෙමින් නිගමන ගොඩනැගීම මෙහිදී භාවිත කරන ක්‍රමවේදාත්මක පසුබිමයි.

*ප්‍රමුඛ පද: පාණදුර, පාණදුරාවාදය, සාහිත්‍යධරයෝ, පුනර්ජීවනය*